# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022
2024 දෙසැම්බර්/ 2025 ජනවාරි

**සමාජීය විද්‍යා පීඨය**

## පුස්තකාල හා විඥාපන විද්‍යාව

**ග්‍රන්ථ විඥාපන පාලනය; වර්ගීකරණ න්‍යාය හා භාවිතය LISC 28224**

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

**අනිවාර්ය ප්‍රශ්නය**

01. ඩිවි දශම වර්ගීකරණයේ එක් වක්‍රයක් භාවිතයෙන් වර්ග අංක සකස් කරන ආකාරය නිදසුන් සහිතව දක්වන්න. (ලකුණු 20)

02. පුස්තකාල වර්ගීකරණ ක්‍රමයකින් අපේක්ෂිත අරමුණු මොනවාදැයි එකිනෙක පහදන්න. (ලකුණු 20)

03. 1. ග්‍රන්ථ වර්ගීකරණ ක්‍රමයක් යන්න ඉතා සැකෙවින් දක්වන්න. (ලකුණු 03)

    11. එවැනි වර්ගීකරණ ක්‍රමයක අඩංගු, ප්‍රධාන සංරචක හා සෙසු සංරචක මොනවාදැයි හඳුනාගත් වර්ගීකරණ ක්‍රමයක් අනුසාරයෙන් විස්තර කරන්න. (ලකුණු 17)

04. "ඩිවි දශම වර්ගීකරණය සාධනීය ලක්ෂණ හා ගුණාංග සමග විවිධ දුර්වලතා අඩංගු වර්ගීකරණ ක්‍රමයකි" උක්ත ප්‍රකාශයෙහි අඩංගු ඩිවි වර්ගීකරණයේ සාධනීය ලක්ෂණ හා ගුණාංග එකිනෙක විස්තර කරන්න. (ලකුණු 20)

05. "විශ්ව දශම වර්ගීකරණයේ අඩංගු පොදු සහායක සංකේත හා පොදු සහායක වක්‍ර ඉතා ප්‍රයෝජනවත් අයුරින් සංවිධානය කර ඇත." උක්ත ප්‍රකාශයෙහි අන්තර්ගත සංකේත අවම වශයෙන් තුනක් (03) සහ වක්‍ර අවම වශයෙන් තුනක් (03) පිළිබඳ නිදසුන් සහිතව විශ්ලේෂණයක යෙදෙන්න. (ලකුණු 20)

06. දෙතිත් වර්ගීකරණය පූර්ණ මුඛාශ්‍රිත වර්ගීකරණ ක්‍රමයක් ලෙස හැඳින්විය හැකිය. විමසන්න. (ලකුණු 20)

07. 1. කොංග්‍රස් පුස්තකාලීය වර්ගීකරණය යනු කුමක්දැයි ඉතා කෙටියෙන් දක්වන්න. (ලකුණු 04)

    11. එම වර්ගීකරණයේ සැකැස්ම එහි ප්‍රධාන වර්ග පංති ලැයිස්තුව උපුටා දක්වමින් පහදන්න. (ලකුණු 08)

    111. එම වර්ගීකරණයේ වාසි එම වර්ගීකරණයේ ලක්ෂණ අනුසාරයෙන් එකිනෙක දක්වන්න. (ලකුණු 08)

08. පහත මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.
    i. සහායක අනුපිළිවෙල
    ii. භේදක ලක්ෂණ
    iii. විෂය මුඛ
    iv. ධූරාවලි අංකනය
    v. අංකනයේ ප්‍රභේද (ලකුණු 4x5=20)

************************